# බලංගොඩ ප්‍රදේශයේ භාවිත දේශීය දැනුම : දේශීය වෙදකම හා කෙම් ක්‍රම ඇසුරෙනි.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එන්. සී. ඩී විජේසේකර**[1]

***ලැගුම්දෙණියේ පියරතන හිමි***

සංක්ෂේපය

පාරම්පරික දැනුම මිනිස් සමාජයකට ආවේණික වූ ඒ ඒ ජාතියට අයත් පෞරාණික උරුමයයි. සමාජයෙන් සමාජයට යුගයෙන් යුගයට ගංගාවකට එකතු වන ඇළක් දොළක් සේ දේශීය දැනුම නැමැති ජලාශයට එකතු වන මෙම අභිනව දැනුම් සම්භාරයත් ඒ ඒ යුගයට අයත් මානව වර්ගයාගේ අදහස් උදහස් පිළිබිඹු වන කැටපතක් ලෙස සැලකිය හැකිය. ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික වූ දේශීය දැනුම වනාහි පුළුල් පරාසයක පැතිර යයි. දේශීය දැනුම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවක් සේ සලකා බලංගොඩ ප්‍රදේශයේ දේශීය දැනුම ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කර තිබේ.

දේශීය දැනුම නැමැති සංකල්පයේ ස්වභාවය පරීක්ෂාවට ලක් කිරීම, බලංගොඩ ප්‍රදේශය තුළ දේශීය වෙදකම සහ කෙම් ක්‍රම යන ක්ෂේත්‍රයන්ට අදාළ දේශීය දැනුම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණ කොට ගත් මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු වන්නේ දේශීය දැනුම බලංගොඩ ප්‍රදේශයේ  භාවිතය පිළිබඳව පරීක්ෂාව, ජනතාව අතරින් අභාවයට යන්නා වූ දේශීය දැනුම විමර්ශනය, වෙනස්කම්වලට භාජනය වී ක්ෂේත්‍ර  නිරීක්ෂණය, මෙම ප්‍රදේශයෙන් තුරන් වී ඇති දේශීය දැනුම හඳුනාගැනීම සහ පවතින දේශීය දැනුම විනාශ වීමට බලපාන ලද හේතු සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කරලීමයි.

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස නිරීක්ෂණ ක්‍රමය භාවිත කළ අතර සම්මුඛ සාකච්ඡා ඇසුරින් තොරතුරු ඒකරාශී කර ගන්නට යෙදුණි. ඒ අනුව දේශීය වෙදකම යටතේ සර්ප වෙදකමල කැඩුම්බිඳුම් වෙදකම ඇස් වෙදකම ගෙඩි වෙදකම, මාන්දම් වෙදකම, ජලභීතිකා රෝගයට ප්‍රතිකාර ආදී වෙදකම් සඳහා භාවිත කරන දේශීය බෙහෙත් වර්ග සම්බන්ධයෙන් අධ්‍යයනය කර තිබේ. කෙම් ක්‍රම යටතේ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කෙම් ක්‍රම නිරීක්ෂණයට භාජනය කොට තිබේ.

අතීතයේ පටන්ම දේශීය දැනුම පැවත එන්නේ වාචිකවය. ඒ නිසා ප්‍රදේශය තුළ දේශීය දැනුම සම්පූර්ණයෙන්ම ලේඛනගත වී නොමැති අතර වර්තමානයේ දී දේශීය දැනුම අභාවයට යමින් පවතී. දේශීය වෙදකම ප්‍රදේශයේ පැවතියත් බටහිර ප්‍රතිකාර කරා බොහෝ දුරට නැඹුරු වන ආකාරයක් දැක ගැනීමට හැකි විය. එසේම කෙම් ක්‍රම අල්ප වශයෙන් භාවිතයට ගන්නා ආකාරයක් මෙන්ම බොහෝ දෑ නවීකරණය වී ඇති ආකාරයක් දැක ගැනීමට හැකියාව ලැබුණි. මේ තත්ත්වය මත ප්‍රදේශයේ දේශීය දැනුම සංරක්ෂණය කර එය ව්‍යාප්ත කිරීම කළ යුතු වේ.

මුඛ්‍ය පදඃ දැනුම , දේශීය දැනුම,  දේශීය වෙදකම,  කෙම් ක්‍රම  , කෘෂිකර්මාන්තය

---

1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
2. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය